# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදා හැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර නීති නිලධාරී (JM 1.1) II ශ්‍රේණිය (පුරප්පාඩු 02) - (ASSIGNMENT BASIS)**

**සුදුසුකම්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීති උපාධිය (LLB) හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් ඒ හා සමාන උපාධියක් සමග Attorney - at - Law සුදුසුකම සහ ප්‍රසිද්ධ නොතාරිස් සුදුසුකම ලබා තිබීම

**හෝ**

(ආ) Attorney - at - Law සුදුසුකම සහ ප්‍රසිද්ධ නොතාරිස් සුදුසුකම ලබා තිබීම

**සමග**

(ඇ) රජයේ / රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක නීති ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 02 ක සේවා පළපුරුද්ද

**වේතනය** : සාකච්ඡා කර තීරණය කළ හැක

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**ආයතනික ප්‍රතිලාභ :**

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ ජීව දත්ත සමග අයදුම්පතක වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. සියළුම අයදුම්පත් 2025.03.30 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන),**

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**

**"මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41, කිරුළ පාර, නාරාහේන්පිට,**

**දුරකථන අංකය 0112 320 356 -9**